# 4.0 දෙවන ජාතික භාෂාව (දෙමළ)

## හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව පිළිබඳ දැනුවත් බව මඟින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම දෙවන ජාතික භාෂාව ඉගෙනීම මඟින් බලාපොරොත්තු වේ.

දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම මඟින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට මෙන් ම ජාතික සමඟිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට ද දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමු වන ප්‍රධාන අවධියේ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකසා ඇත.

මෙහි දී සවන් දීම හා කතා කිරීම යන භාෂා ක්ෂේත්‍ර සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇත. ඒ අනුව මෙම නිපුණතා සකසා ඇත්තේ සිසුන්ගේ වයස, පරිණතිය හා ඔවුන්ගේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින් ය.

## ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
- භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
- භාෂාවක් හැසිරවීමේ යහ පුරුදු ප්‍රදර්ශනය කරයි.
- අන් අය ඉදිරියේ තම අදහස් ද ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
- කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරමින් එය අර්ථාන්විත ව භාවිත කරයි.
- කවි, ගී අසමින් ගයමින් රස විඳියි.
- තවත් භාෂාවක් හැසිරවීම මඟින් වින්දනයක් ලබයි.
- තවත් භාෂාවක් හැසිරවීමට ඇති හැකියා අගයයි.

## පළමු වන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදිව හා සුහද ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සුහද ව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනත ව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන නිවැරදි උච්චාරණයෙන් යුතු ව නම් කරයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

**දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා**

- උපන් දින සඳහා සුබ පතයි.
- ආචාරශීලී ව, සුහද ව ඉල්ලීම් කරයි.
- පවුලේ සාමාජිකයන්ගේ ඥාතීත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.
- 1-10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.
- පාට නම් කරමින් සරල වැකි කියයි.
- අන්‍යොන්‍ය සුහදතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.
- එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ නම් කරයි.
- ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.
- අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිපදෙනකු නම් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

සැලසුම් සහගත ක්‍රියාකාරකම් ඇසුරින් දෙවන ජාතික භාෂාවට අදාළ ව අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය ය. සිසුන් අදාළ නිපුණතා කරා ළඟා කර ගැනීමේ ලා යෝජිත ක්‍රියාකාරකම් යොදා ගැනීමට මෙන්ම අවස්ථෝචිත ව ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ද ඔබට නිදහස ඇත.

## දෙවන ජාතික භාෂාව (දෙමළ)

### විෂය නිර්දේශය

**නිපුණතාව**

උපන් දින සඳහා සුබ පතයි.

| | | |
|---|---|---|
| **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள** | ඉනිය පිරන්දනාළ් වාල්ත්තුක්කළ් | (සුබ උපන් දිනයක් වේවා) |
| நன்றி | නන්රි | (ස්තුතියි) |

**නිපුණතාව**

ආචාරශීලී ව හා සුහද ව ඉල්ලීම් කරයි.

| | | |
|---|---|---|
| புத்தகம் எடுங்கள் | පුත්තහම් එඩුංගළ් | (පොත ගන්න.) |
| பென்சில் தாருங்கள் | පෙන්සිල් තාරුංගළ් | (පැන්සල දෙන්න.) |
| இங்கே வாருங்கள் | ඉංගේ වාරුංගළ් | (මෙහෙ එන්න) |
| அங்கே போங்கள்/செல்லுங்கள் | අංගේ පෝංගළ් | (එහෙ යන්න.) |
| இங்கே பாருங்கள் | ඉංගේ පාරුංගළ් | (මෙහෙ බලන්න) |
| அங்கே இருங்கள் | අංගේ ඉරුංගළ් | (අතනින් ඉඳගන්න) |
| அங்கே ஓடுங்கள் | අංගේ ඕඩුංගළ් | (අතනට දුවන්න) |
| இங்கே நில்லுங்கள் | ඉංගේ නිල්ලුංගළ් | (මෙහෙ නවතින්න) |

**නිපුණතාව**

පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| அம்மா | අම්මා | (අම්මා) |
| அப்பா | අප්පා | (තාත්තා) |
| அக்கா | අක්කා | (අක්කා) |
| அண்ணா | අණ්ණා | (අයියා) |
| தங்கை | තංගෛ | (නංගී) |
| தம்பி | තම්බි | (මල්ලි) |

**නිපුණතාව**

මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.

| | |
|---|---|
| உங்கள் அம்மா பெயர் என்ன? | උංගළ් අම්මා පෙයර් එන්න ?<br>(ඔයාගේ අම්මාගේ නම මොකක් ද ? |
| எனது அம்மா பெயர் ............ | එනදු අම්මා පෙයර්<br>(මගේ අම්මාගේ නම ....................) |
| உங்கள் அப்பா பெயர் என்ன? | උංගළ් අප්පා පෙයර් එන්න ?<br>(ඔයාගේ තාත්තාගේ නම මොකක් ද ? |
| எனது அப்பா பெயர் ............ | එනදු අප්පා පෙයර්<br>(මගේ තාත්තාගේ නම ....................) |

| | |
|---|---|
| உங்கள் அண்ணா பெயர் என்ன? | උංගළ් අණ්ණා පෙයර් එන්න ?<br>(ඔයාගේ අයියාගේ නම මොකක් ද ? |
| எனது அண்ணா பெயர் ............ | එනදු අණ්ණා පෙයර්<br>(මගේ අයියාගේ නම .....................) |
| உங்கள் அக்கா பெயர் என்ன? | උංගළ් අක්කා පෙයර් එන්න ?<br>(ඔයාගේ අක්කාගේ නම මොකක් ද ? |
| எனது அக்கா பெயர் ............ | එනදු අක්කා පෙයර්<br>(මගේ අක්කාගේ නම .....................) |
| உங்கள் தங்கை பெயர் என்ன? | උංගළ් තංගෛ පෙයර් එන්න ?<br>(ඔයාගේ නංගිගේ නම මොකක් ද ? |
| எனது தங்கை பெயர் ............ | එනදු තංගෛ පෙයර්<br>(මගේ නංගිගේ නම .....................) |
| உங்கள் தம்பி பெயர் என்ன? | උංගළ් තම්බි පෙයර් එන්න ?<br>(ඔයාගේ මල්ලිගේ නම මොකක් ද ? |
| எனது தம்பி பெயர் ............ | එනදු තම්බි පෙයර්<br>(මගේ මල්ලිගේ නම .....................) |
| எனக்கு அக்கா இல்லை | එනක්කු (අක්කා) ඉල්ලෛ<br>(මට අක්කා කෙනෙක් නැහැ) |

**නිපුණතාව**

1 - 10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

| | | |
|---|---|---|
| ஒன்று | ඔන්රු | (එක) |
| இரண்டு | ඉරණ්ඩු | (දෙක) |
| மூன்று | මූන්රු | (තුන) |
| நான்கு | නාන්ගු | (හතර) |
| ஐந்து | ඓන්දු | (පහ) |
| ஆறு | ආරු | (හය) |
| ஏழு | ඒළු | (හත) |
| எட்டு | එට්ටු | (අට) |
| ஒன்பது | ඔන්බදු | (නවය) |
| பத்து | පත්තු | (දහය) |

**නිපුණතාව**

පාට නම් කරමින් සරල වැකි කියයි.

| | | |
|---|---|---|
| வானம் நீல நிறம் | වානම් නීල නිරම් | (අහස නිල් පාට යි) |
| இலை பச்சை நிறம் | ඉලෛ පච්චෛ නිරම් | (කොළය කොළ පාට යි) |
| வாழைப்பழம் மஞ்சள் நிறம் | වාළෛප්පළම් මඤ්ජළ් නිරම් | (කෙසෙල් කහ පාට යි) |
| கொக்கு வெள்ளை நிறம் | කොක්කු වෙළ්ළෛ නිරම් | (කොකා සුදු පාට යි) |
| காகம் கறுப்பு நிறம் | කාහම් කරුප්පු නිරම් | (කපුටා කළු පාට යි) |
| ஜம்பு சிவப்பு நிறம் | ජම්බු සිවප්පු නිරම් | (ජම්බු රතු පාට යි) |

නිපුණතාව

අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.

| | | |
|---|---|---|
| எப்படி சுகம்? | එප්පඩි සුහම් ? | (සැප දුක් කොහොම ද ?) |
| நல்ல சுகம் | නල්ල සුහම් | (සුවෙන් සිටිනවා) |

නිපුණතාව

එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ කිහිපයක් නම් කරයි.

| | | |
|---|---|---|
| பென்சில் | පෙන්සිල් | (පැන්සල) |
| புத்தகம் | පුත්තහම් | (පොත) |
| மேசை | මේසෙ | (මේසය) |
| கதிரை | කදිරෙ | (පුටුව) |
| அடிமட்டம் | අඩිමට්ටම් | (අඩිකෝදුව) |

නිපුණතාව

ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| இடியப்பம் | ඉඩියප්පම් | (ඉඳිආප්ප) |
| பிட்டு | පිට්ටු | (පිට්ටු) |
| சோறு | සෝරු | (බත්) |
| பாற்சோறு | පාට් සෝරු | (කිරිබත්) |
| அப்பம் | අප්පම් | (ආප්ප) |

නිපුණතාව

අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිප දෙනෙකු නම් කරයි.

| | | |
|---|---|---|
| நாய் | නාය් | (බල්ලා) |
| பூனை | පූනෛ | (පූසා/බළලා) |
| காகம் | කාහම් | (කපුටා) |
| கிளி | කිළි | (ගිරවා) |
| அணில் | අණිල් | (ලේනා) |

*සැ.යු. : මෙම විෂය ක්ෂේත්‍රය තුළ හඳුන්වා දී ඇති වචන කථනය සඳහා මිස ලිවීම සඳහා නොවන බව අවධාරණය කරමු.*

## නිපුණතාව : උපන්දින සඳහා සුබ පතයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුවරයා පන්තියේ සිසුන්ට **வணக்கம்** (වණක්කම්) ලෙස ආචාර කරන්න.
- පන්තියේ සිසුන් ද **வணக்கம்** (වණක්කම්) ලෙස ප්‍රතිචාර දක්වීමට යොමු කරන්න.
- ඕනෑම අයෙකුගේ උපන් දිනයක දී අප විසින් සුබ පැතුම් කිරීම හොඳ පුරුද්දක් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- අප 'සුබ උපන් දිනයක් වේ වා' ලෙස සිංහල භාෂාවෙන් කරන සුබ පැතීම **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்** (ඉනිය පිරන්දනාල් වාල්ත්තුක්කල්) ලෙස දෙමළ බසින් කළ හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.
- මෙම වගන්තිය සිසුන් ලවා කිහිප වරක් උච්චාරණය කරවන්න.
- නිවැරදි උච්චාරණය හුරු කරවීම සඳහා වචනයෙන් වචනය වෙන් වශයෙන් උච්චාරණයට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**


- සුබ පැතීම් සඳහා භාවිත කරන වැකි හොඳින් තහවුරු කරගත් පසු ගුරුවරයා සිසුන්ට බෝනික්කකු පෙන්වා ඇයට සුදුසු නමක් සිසුන් ලවා යෝජනා කරගන්න.
- අද දිනට බෝනික්කාගේ උපන් දිනය යෙදී ඇති හෙයින් සියලු දෙනා එක් වී බෝනික්කාට සුබ පතමු යැයි පවසා දෙමළ බසින් බෝනික්කාට සුබ පතන්න.
- සිසුන් බෝනික්කා වෙත සුබ පැතීම කළ පසු, ගුරුවරයා ඒ සඳහා **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දක්වන්න.
- අපට යම් අයකු සුබ පැතීමක් කළ විට හෝ අප යම් උදවුවක්/උපකාරයක් කළ විට අප විසින් ස්තුති යි යැයි පැවසීම හොඳ පුරුද්දක් බව ද දෙමළ බසින් **நன்றி** (නන්රි) යන වචනයෙන් 'ස්තුති යි' යන අදහස ප්‍රකාශ වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- **நன்றி** (නන්රි) ස්තුති යි වචනය ද සිසුන් හොඳින් තහවුරු කරගන්නා තෙක් කිහිප වරක් උච්චාරණය කරවන්න.
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකු අතට බෝනික්කා වරින් වර ලබා දී අනෙක් සිසුන් ලවා බෝනික්කාට සුබ පැතීමටත් බෝනික්කා අත ඇති සිසුන් විසින් **நன்றி** (නන්රි) ස්තුති යි ලෙස ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න. රවුමේ මැද ගුරුතුමිය සිටගන්න.
- 'අද මගේ උපන් දිනය. හැම දෙනා ම මට සුබ පතන්න.' යනුවෙන් පවසා එක් එක් සිසුවාට දෙමළ බසින් උපන් දින සුබ පැතීම් සඳහා ඉගෙන ගත් වැකිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා විසින් **நன்றி** (නන්රි) ස්තුති යි යනුවෙන් ප්‍රතිචාර දැක්වීම සිදු කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. ඉන් එක් සිසුවකු කණ්ඩායමේ මැද සිටුවා අනෙක් සිසුන් ලවා එම සිසුවා හට උපන් දින සුභ පැතීම් සිදු කරන්න.
- සුබ පැතුම් ලබන සිසුවා **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දැක්වීමට ද යොමු කරන්න.
- මේ ආකාරයට කණ්ඩායමේ සියලු සිසුන්ට රවුම මැදට පැමිණ සුබ පැතුම් ලැබීමට හා ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- පහත සඳහන් පරිදි සකසා ගත් වර්ණ සහිත මල් එක බැගින් සිසුන්ට ලබා දෙන්න.

  *උදා :* පන්තියේ  සිසුහු 25ක් සිටිත් නම් එක් වර්ණයකින් මල් 5 බැගින් මල් 25ක් සකසා ගන්න.




- සිසුන් පළමු වන ශ්‍රේණියේ දී ඉගෙන ගත් වර්ණ පිළිබඳ අවබෝධය තව දුරටත් තහවුරු  කර ගැනීම සඳහා ගුරුවරයා පාට පහකින් යුත් මල් අතට ගෙන එකිනෙක පෙන්වා දෙමළ බසින් එහි දැක්වෙන පාට පිළිබඳ විමසන්න.

  *උදා :* **நீல நிறம்** (නීල නීරම්) නිල් පාට
- මේ ආකාරයට පාට පහ ම සිසුන් හඳුනාගෙන එම වර්ණ හඳුන්වන නම්  උච්චාරණය කළ පසු ක්‍රියාකාරකම් ආරම්භ කරන්න.
- ගුරුවරයා රවුම මැද සිටගන්න.
- ගුරුවරයා විසින් ඉහත සඳහන් වර්ණ අතුරින් එක් වර්ණයක් පවසන්න.
  *උදා :* **நீல நிறம்** (නීල නීරම්) නිල් පාට
- එම වර්ණය සහිත මල් අත ඇති සිසුන් ඉදිරියට කැඳවන්න.
- ඉන් පසු එක් එක් සිසුවා තමා අතැති මල ගුරුවරයා අතට දී ගුරුවරයාට, **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்** (ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කළ්) සුබ උපන්දිනයක් වේ වා යනුවෙන් සුබ පැතීමට යොමු කරන්න.
- මෙහිදී ගුරුතුමිය විසින් **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතු ය.
- නැවතත් සිසුන් රවුමේ තමන් සිටින තැනට යොමු කරන්න. නැවත වෙනත් වර්ණයක් ගුරුවරයා නම් කරන්න.   එම සිසුන්ට ද  ඉහත ආකාරයට සුබ පැතීම කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  මේ ආකාරයට ගුරුවරයා සියලු වර්ණ නම් කරමින් සියලු සිසුන් ක්‍රියාකාරකම සඳහා සම්බන්ධ කරගන්න.

**ක්‍රියාකාරකම** 4

- ක්‍රියාකාරකම 3 සඳහා යොදා ගත් මල් මෙම ක්‍රියාකාරකම සඳහා ද භාවිත කරන්න.
- එක් වර්ණයක මල් සහිත සිසුන් හා තවත් වර්ණයක මල් සහිත සිසුන් මුහුණට මුහුණ ලා සිටින සේ රූපයේ දැක්වෙන ආකාරයට පේළියට සිටුවන්න.



නිල් වර්ණය සහිත මල් අතැති සිසුහු

කොළ වර්ණය සහිත මල් අතැති සිසුහු

- නිල් වර්ණය සහිත මල් රැගත් සිසුන් විසින් කොළ වර්ණයේ මල් සහිත සිසුන්ට තමා ළඟ ඇති මල ලබා දී සුබ පැතීම් කිරීමටත් කොළ වර්ණය සහිත අයට ඒ සඳහා 'නන්රි' ලෙස ප්‍රතිචාර දැක්වීමටත් උපදෙස් ලබා දෙන්න.
- නැවත කොළ වර්ණය සහිත සිසුන් තමා අත පෙර තිබූ කොළ පාට මල තමා ඉදිරියෙන් සිටින සිසුන්ට ලබා දී පෙර පරිදි ම සුබ පැතීම් කිරීමටත් අනෙක් කණ්ඩායමේ සිසුන් විසින් ප්‍රතිචාර දැක්වීමටත් යොමු කරන්න.
- පන්තියේ සියලු ම සිසුන් සහභාගි වන ආකාරයට මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.
- සිසුන්ගේ අත ඇති මල්වල වර්ණ හුවමාරු වන සේ බෙදා දී පෙර පරිදි ම මෙම ක්‍රියාකාරකම නැවත නැවත සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- උපන්දින සුබ පැතීම ගීතයකින් සිදු කිරීමට සූදානම් වන ලෙස සිසුන්ට පවසන්න.
- ආසන්න දිනයක දී උපන්දිනය සමරන හෝ උපන්දිනය සැමරූ හෝ සිසුවකු ඉදිරියට කැඳවන්න.

  ( Happy birthday to you . . . . ගීතයේ තනුවට අනුව මෙම ගීතය ගායනා කරන්න.)

| | |
|---|---|
| ඉනිය පිරන්ද නාල් වාල්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
| ඉනිය පිරන්ද නාල් වාල්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
| ඉනිය පිරන්ද නාල් වාල්තුක්කල් (සමන්/. . . .) | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
| ඉනිය පිරන්ද නාල් වාල්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |

- සැම සිසුවෙකුගේ ම උපන් දින යෙදෙන දවස් මේ ආකාරයට සිසුන් ලවා සුබ පැතීම් සිදු කරන්න.

## නිපුණතාව : ආචාරශීලී ව හා සුහද ව ඉල්ලීම් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- ගුරුවරයා **ஓடுங்கள்** (ඕඩුංගළ්) දුවන්න හා **நில்லுங்கள்** (නිල්ලුංගළ්) නවතින්න යන විධාන සිසුන්ට නැවත මතක් වන සේ වරින් වර ලබා දෙමින් සිසුන් එක තැන දිවීමටත්, දිවීම නැවැත්වීමටත් කටයුතු කරන්න.
- ගුරුවරයා **அங்கே** (අංගේ) යන වචනයෙන් අදහස් වන්නේ **'අතනට'** යන්නත්, **இங்கே** (ඉංගේ) යන වචනයෙන් අදහස් වන්නේ 'මෙතනට' යන්නත් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර පහත දැක්වෙන ආකාරයට විධාන ලබා දෙන්න.
  **ஓடுங்கள்** (ඕඩුංගළ්) - දුවන්න, **நில்லுங்கள்** (නිල්ලුංගළ්) - නවතින්න, **இங்கே வாருங்கள்** (ඉංගේ වාරුංගළ් ) - මෙහෙ එන්න
- මේ ආකාරයට ම පහත දැක්වෙන විධාන ද යොදා ගනිමින් ක්‍රියාකාරකම සංවිධානය කරගන්න.

  **இங்கே பாருங்கள்** (ඉංගේ පාරුංගළ්) මෙහෙ බලන්න

  **இங்கே வாருங்கள்** (ඉංගේ වාරුංගළ්) මෙහෙ එන්න

  **இங்கே நில்லுங்கள்** (ඉංගේ නිල්ලුංගළ්) මෙහෙ නවතින්න

  **அங்கே போங்கள்** (අංගේ පෝංගළ්) එහෙ යන්න

  **அங்கே இருங்கள்** (අංගේ ඉරුංගළ්) අතනින් ඉඳගන්න

**ක්‍රියාකාරකම 2**

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම නායකයකු බැගින් පත් කරන්න.
- නායකයා විසින් ක්‍රියාකාරකම 01 හි දී ගුරුවරයා විසින් සිදු කරන ලද ආකාරයට තම කණ්ඩායමේ අනෙක් සිසුන්ට විධාන ලබා දිය යුතු අතර එම සිසුන් විධානයට අනුව ප්‍රතිචාර දැක්විය යුතු වේ.
- නායකයා ලෙස කටයුතු කිරීමට සෑම සිසුවෙකුටම අවස්ථාව සැලසෙන පරිදි මෙම ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- මෙම නිපුණතාව යටතේ හඳුන්වා දී ඇති සුහද ඉල්ලීම් සඳහා වන වැකි පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කරන අතර සුදුසු පරිදි භාවිත කරන්න.
- සිසුන් ද එම වැකි භාවිතයට යොමු වන සේ අවස්ථා සම්පාදනය කරන්න.

## නිපුණතාව : පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන අය පැහැදිලි ව පෙන්නුම් කරන ආකාරයට දඬු රූකඩ 6ක් සකසා ගන්න.
- තම නිවසේ සිටින සාමාජිකයෝ කවුරු දැයි සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.

  *උදා :* අම්මා, තාත්තා, අයියා, අක්කා, නංගි, මල්ලි
- ගුරුවරයා විසින් 'අම්මා ' ලෙස සකස් කරගත් දඬු රූකඩය ඉදිරිපත් කරන්න.

  'මේ අපේ අම්මා'. 'අම්මා ට' දෙමළ බසින් **அம்மா** 'අම්මා' යන්න ම භාවිත කරන බව සිසුන්ට පැහැදිලි කරන්න.
- 'අම්මා' යන්න සිසුන් සමඟ කිහිප වරක් උච්චාරණය කරන්න.
- දෙවනු ව තාත්තාගේ දඬු රූකඩය ඉදිරිපත් කර 'මේ තාත්තා'- 'තාත්තාට' දෙමළ භාෂාවෙන් **அப்பா** 'අප්පා' යනුවෙන් භාවිත කරන බව පවසා සිසුන් සමඟ එම වචනය ද උච්චාරණය කරන්න.
- 'අක්කා' ගේ දඬු රූකඩය ඉදිරිපත් කර දෙමළ භාෂාවෙන් ද 'අක්කා'ට **அக்கா** 'අක්කා' යනුවෙන් භාවිත කරන බව පවසන්න. එම වචනය ද සිසුන් සමඟ කිහිප වරක් උච්චාරණය කරන්න.
- මේ ආකාරයට ම 'අයියා' යන්න සඳහා **அண்ணா** 'අණ්ණා' ලෙස යෙදෙන බව ද, 'නංගි' යන්න සඳහා **தங்கை** 'තංගෛ' ලෙස යෙදෙන බව ද, 'මල්ලි' යන්න සඳහා **தம்பி** 'තම්බි' යන්න යෙදෙන බව ද පැහැදිලි කරන්න.
- ගුරුවරයා විසින් භාවිත කරන ලද දඬු රූකඩ සියල්ල රැගෙන එක් එක් රූපය ඉදිරිපත් කරමින් පන්තියේ සිසුන්හට ඒ අය කවුරුන් දැයි දෙමළ බසින් හඳුන්වන ලෙස පවසන්න.
- සිසු අවබෝධය පිරික්සා බැලීම සඳහා අහඹු ලෙස නම් කරනු ලබන සිසුන්ගෙන් ද පිළිතුරු ලබා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- එළිමහනේ සුදුසු ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- පවුලේ සාමාජිකයන් පිළිබඳ ගීතයක් ගැයීමට සූදානම් වන ලෙස පවසා පහත දැක්වෙන ගීතය පේළියෙන් පේළිය ගුරුවරයා විසින් ගායනා කරන්න.

  , , ąd , , , , d ' ' ' $

  | | |
  |---|---|
  | wï udtx. , awï ud | wl ła dtx. , awl ła d |
  | wmmd tx. , awmmd | ; ï ì tx. , a; ï ì |
  | wK ła dtx. , awK ła d | ; xf f . tx. , a; xf f . |
  | , , ąd , , , , d ' ' ' $ | , d, ą , , , , d ' ' ' $ |


- මෙම ගීතයේ 'එංගල්' යනුවෙන් අදහස් වන්නේ 'අපේ' යන්න යි.
- පසු ව ගීතය පෙළින් පෙළ සිසුන් සමඟ ද ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 3**

- පන්තියේ සිසුන් එළිමහනේ සුදුසු ස්ථානයකට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- ක්‍රියාකාරකම 1 සඳහා සකස් කරගත් පවුලේ සාමාජිකයන්ගේ දඬු රූකඩ හය සිසුන් අතර බෙදා දෙන්න.
- ගීතයක් වාදනය වීමට සලස්වා දඬු රූකඩ අතින් අත මාරු කරගන්නා ලෙස පවසන්න. ගීතය නතර කරන අවස්ථාවේ දී දඬු රූකඩ අතැති සිසුන්ට තමා කවුරු දැයි හඳුන්වා දිය යුතු ය.

  *උදා :* * මවගේ දඬු රූකඩය අතැති සිසුවා - **நான் அம்மா** නාන් අම්මා (මම අම්මා)

  * අයියාගේ දඬු රූකඩය අතැති සිසුවා - **நான் அண்ணா** නාන් අණ්ණා (මම අයියා)
- මේ ආකාරයට දඬු රූකඩ අතැතිව සිටින සිසුන් හය දෙනාගෙන් ම ප්‍රකාශ ලබා ගන්න. නැවත ගීතය වාදනය වීමට සලස්වා පෙර පරිදි ම ක්‍රියාකාරකම සිදු කරන්න.
- සිසුන්ට වචන පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.





**ක්‍රියාකාරකම 4**


- පන්තියේ සිසුන් 6 දෙනා බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
- සෑම සිසු කණ්ඩායමකට ම අම්මා, තාත්තා, අක්කා , අයියා , නංගි , මල්ලි යන චරිත සඳහා සුදුසු වෙස් ගැන්වීම් සිදු කරන්න.
- සිසුන් තනි තනි ව පන්තිය ඉදිරියට පැමිණ තමා හඳුන්වාදීමට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* **நான் தங்கை** (නාන් තංගෛ) මම නංගි
- පසු ව චරිත අනුකරණයට යොදාගත් ද්‍රව්‍ය සිසුන් අතර හුවමාරු කරමින් එම චරිත හඳුන්වාදීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 5**

- එක් කාඩ්පතක පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකු නියෝජනය වන ආකාරයට පන්තියේ සිටින සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් වන සේ රූප කාඩ්පත් සකසා ගන්න.
- මේ ආකාරයට සකසා ගත් කාඩ්පත් එක් සිසුවකුට එක බැගින් වන සේ බෙදා දෙන්න.
- සෑම කාඩ්පතක ම දැක්වෙන්නේ පවුලක සාමාජිකයන් බව පවසන්න
- පසුව එක් එක් සිසුවාගෙන් තමා සතු ව ඇති කාඩ්පතේ දැක්වෙන පවුලේ සිටින සාමාජිකයින් කවුරු ද යන වග දෙමළ භාෂාවෙන් පැවසීමට යොමු කරන්න.
- සිසුන් අතර කාඩ්පත් හුවමාරු කරමින් දරුවන් තුළ පවුලේ සාමාජිකයන් පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.





## නිපුණතාව : මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුතුමිය පන්තියේ සිසුන් ඉදිරියේ සිටගෙන

  නාන් කුමාරි (මම කුමාරි)

  එනදු පෙයර් කුමාරි (මගේ නම කුමාරි)

  එනදු අම්මා පෙයර් ලතා (මගේ අම්මාගේ නම ලතා) ආදි වශයෙන් පවසන්න.
- මේ ආකාරයට වාර කිහිපයක් උච්චාරණය කරන්න.
- පසු ව අහඹු ලෙස තෝරා ගන්නා සිසුවකුගෙන් **உங்கள் பெயர் என்ன?**(උංගල් පෙයර් එන්න) ලෙස විමසා පිළිතුරු ලබා ගන්න.
- නැවත **உங்கள் அம்மா பெயர் என்ன?**උංගල් අම්මා පෙයර් එන්න? (ඔයාගේ අම්මාගේ නම මොකක් ද ?) ලෙස විමසා පිළිතුරු ලබා ගන්න.
- සිසුන් දෙදෙනා බැගින් පන්තිය ඉදිරියට කැඳවන්න.
- සිසුන් දෙදෙනාට පහත දැක්වෙන ආකාරයේ දෙබසක් ගොඩනැඟීමට අවස්ථාව ලබා දෙන්න

  **உங்கள் பெயர் என்ன?** උංගල් පෙයර් එන්න ?

  **எனது பெயர்** එනදු පෙයර් ...................... (ජනක)

  **உங்கள் அம்மா பெயர் என்ன?** උංගල් අම්මා පෙයර් එන්න?

  **எனது அம்மா பெயர் ............** එනදු අම්මා පෙයර් ....................( සීතා)

- මේ ආකාරයට අප්පා (තාත්තා), අක්කා (අක්කා), අණ්ණා (අයියා),තංගෛයි (නංගි) තම්බි (මල්ලි) යන අයගේ තොරතුරු විමසීමට ද සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- අම්මා. තාත්තා, අක්කා, අයියා, නංගී, මල්ලි යන අයගේ රූප තරමක ගනකමින් යුතු කාඩ්පත්වල අලවා පන්තියේ සිසු කණ්ඩායම්වලට එක් කට්ටලය බැගින් ලබා දිය හැකි ප්‍රමාණයට සකසා ගන්න.
- සෑම කාඩ්පත් කට්ටලයක් ම කුඩා පෙට්ටියක් තුළට දමන්න.
- ඒවා කණ්ඩායම්වලට ලබා දී වරකට එක් කාඩ්පත බැගින් එක් සිසුවකුට ලබා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- කාඩ්පත් ලබා ගත් සිසුවා අම්මාගේ රූපය සහිත කාඩ්පත තෝරා ගත්තේ නම් ඔහු/ ඇය තමාට දකුණු පසින් සිටින සිසුවාගෙන් 'උංගල් අම්මා පෙයර් එන්න' ලෙස විමසිය යුතු අතර අනෙක් සිසුවා ඊට පිළිතුරු ලබාදිය යුතු ය.
- මේ ආකාරයට හඳුන්වා දි ඇති ප්‍රකාශ සිසුන් තුළ හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.
- යම් අවස්ථාවක 'මට අක්කා කෙනෙක් නැහැ' වශයෙන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වුවහොත් එය පහත දක්වා ඇති ආකාරයට සිදු කළ හැකි ය.

  **எனக்கு அக்கா இல்லை** (එනක්කු අක්කා ඉල්ලෛ) මට අක්කා කෙනෙක් නැහැ . . . ආදි වශයෙනි.

## නිපුණතාව : 1 - 10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පළමු වන ශ්‍රේණියේ දී 1 සිට 5 තෙක් සංඛ්‍යා දෙමළ බසින් පැවසීමට සිසුන් හැකියාව ලබා ඇති බැවින් එම මතකය ආවර්ජනය කිරීම සඳහා සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායමකට සිසුන් 5ක් හෝ 6ක් වන සේ කුඩා කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන් කරන්න.
- සැම සිසු කණ්ඩායමකට සකස් කරගත් කුඩා ප්‍රමාණයේ කොඩි 10ක් හා ඒවා රඳවිය හැකි ආකාරයේ වැලි පිරවූ බඳුනක් ද ලබා දෙන්න.
- ගුරුවරයා දමිළ බසින් 1-5 අතර සංඛ්‍යාවක් පවසන්න. ඊට ගැළපෙන ප්‍රමාණයෙන් කොඩි කණ්ඩායමේ සියලු ම සිසුන්ගේ එකඟතාව මත බඳුන තුළ රඳවිය යුතු බවට උපදෙස් ලබා දෙන්න.

  *උදා :* ගුරුවරයා -: **ஐந்து** ඓන්දු (පහ)

  ළමයි :- (කොඩි පහක් බඳුන තුළ රඳවිය යුතු ය.)
- 1 - 5 තෙක් සංඛ්‍යා නාම පිළිබඳ මතකය ආවර්ජනය වන සේ ක්‍රියාකාරකම කිහිප වරක් සිදු කරන්න.
- අනතුරු ව 6 හා 7 යන සංඛ්‍යා සඳහා භාවිත කරන සංඛ්‍යා නාම සිසුන්ට හඳුන්වා දෙන්න.

  *උදා :* 6 - **ஆறு** ආරු (හය)


  7 - **ஏழு** ඒළු (හත)
- සිසුන් සමඟ අත්පුඩි ගසමින් 1 - 7 තෙක් සංඛ්‍යා දෙමළ බසින් කියන්න.
- පෙර පරිදි ක්‍රියාකාරකම සිදු කරන අතර ගුරුවරයා විසින් **ஆறு (ආරු) - 'හය'**, **ஏழு (ඒළු) - 'හත'** යන වචන වැඩි වාර ගණනක් භාවිත වන පරිදි කොඩි භාවිත කරමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- මේ ආකාරයට **எட்டு** (එට්ටු) - 'අට', **ஒன்பது** (ඔන්බදු) - 'නවය', **பத்து** (පත්තු) - 'දහය' සංඛ්‍යා ද හඳුන්වා දෙන්න.
- කොඩි භාවිත කරමින් සිදු කළ ක්‍රියාකාරකම 8 -10 තෙක් සංඛ්‍යා යොදා ගනිමින් ද සිදු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමට සිටුවන්න.
- 1-10 තෙක් ඉලක්කම් ලියූ කාඩ්පත් කුඩා මල්ලක දමා ගන්න.
- එම මල්ල සිසුන්ගේ අතින් අත යවන්න.
- ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව කාඩ්පත් මල්ල අතින් අත යැවීම නතර කරන්න.
- ගුරුවරයා **எடுங்கள்** (එඩුංගළ්) ගන්න කියූ විට මල්ල අතැති සිසුවා මල්ලෙන් කාඩ්පතක් ගත යුතු ය.
- ගුරුවරයා **சொல்லுங்கள்** (සොල්ලුංගළ්) කියන්න කියූ විට කාඩ්පතේ ඇති ඉලක්කම දෙමළ බසින් පැවසිය යුතු ය.
- සිසුහු නිවැරදි ව ඉලක්කම හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරත් දැයි විමසිලිමත් වන්න. අවශ්‍ය අවස්ථාවක දී නිවැරදි කිරීම් සිදු කරන්න.
- නැවත සිසුවා ලබා ගත් කාඩ්පත එම මල්ලට ම දමා එම මල්ල සිසුන්ගේ අතින අත යවන්න. පෙර පරිදි ම ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් පේළි දෙකකට සිටුවන්න.
- පේළි දෙක ඉදිරියෙන් වැලි පිරවූ භාජන දෙකක් තබන්න. වර්ණ $A_4$ භාවිතයෙන් නිර්මාණය කරගත් 1-10 තෙක් සංඛ්‍යා වෙන ම ලියූ කොඩි කට්ටල දෙකක් සකසා ගන්න.
- කොඩි කට්ටල දෙක රූපයේ දැක්වෙන ආකාරයට වැලි පිරවූ භාජන දෙකක රඳවන්න




- ගුරුවරයා සංඛ්‍යාවක් දෙමළ බසින් පැවසූ විට කණ්ඩායම් දෙකේ පළමු සිසුන් දෙදෙනා දිවගොස් තම පේළිය ඉදිරියේ ඇති බඳුනෙන් නිවැරදි සංඛ්‍යාව දැක්වෙන කොඩිය රැගෙන ගුරුවරයාට පෙන්වා එම සංඛ්‍යාව දෙමළ බසින් ප්‍රකාශ කළ යුතු ය.
- පසු ව එම කොඩිය නැවත බඳුනේ රඳවා තමාගේ කණ්ඩායමේ පසුපසින් වාඩි විය යුතු ය.
- කණ්ඩායම් දෙකේ ම සියලු ම සිසුන් සහභාගි වන තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට වුව ද සංවිධානය කර ගත හැකි ය.

**ක්‍රියාකාරකම 4**


- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- 1 - 10 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පත් සිසුන් අතර බෙදා දෙන්න.
- ගුරුවරයා දෙමළ බසින් පවසන සංඛ්‍යාව අතැති සිසුන් රවුමේ ඉදිරියට පැමිණිය යුතු ය.
- ඉදිරියට ආ සිසුන්ට ගුරුවරයා ලබා දෙන විධානයකට අනුව ක්‍රියා කළ යුතු ය.

  *උදා :* **கை தட்டுங்கள்** 'කෛතට්ටුංගළ්', **நில்லுங்கள்** 'නිල්ලුංගළ්', **இருங்கள்** 'ඉරුංගළ්'
- සිසුන් නිවැරදි ව විධානයට අනුව ප්‍රතිචාර දැක්වූ පසුව ගුරුවරයා **போங்கள்** පෝංගළ් (යන්න.) කියා සිසුන් නැවත රවුමට පිටත් කළ යුතු ය.
- සිසුන් රවුමේ තමන්ට හිමි ස්ථානවලට ගිය පසු ඊළඟ සංඛ්‍යා නාමය පවසන්න.
- සෑම සිසුවකුට ම අවස්ථාව ලැබෙන තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- 1-10 තෙක් සංඛ්‍යා දැක්වෙන රූප කාඩ්පත් පන්ති සිටින සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් වන ලෙස සකසා ගන්න.
- ඒවා සෑම එකකට ම මාලයක් සේ පැළැඳිය හැකි වන අයුරින් සුදුසු පටියක් ද සවි කරන්න.

*උදා :*



- සිසුන් එළිමහනට රැගෙන ගොස් සෑම සිසුවකුට ම සකස් කරගත් කාඩ්පත බැගින් ලබා දී ඒවා ගෙලෙහි පලඳවා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- කැසට් පටයක් ආධාරයෙන් ගීතයක් වාදනය කරන්න. ගීතය වාදනය වන අතර සිසුන්ට රවුම වටේ සෙමෙන් දිවීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතය වාදනය වන අතර ගුරුතුමිය විසින් එම වාදනය නතර කර, යම් සංඛ්‍යාවක් ප්‍රකාශ කළ යුතු ය. එම සංඛ්‍යාව දැක්වෙන කාඩ්පත් හිමි සිසුන් රවුමේ මැදට පැමිණිය යුතු වේ.
- නැවත ගීතය වාදනය වීමට සලස්වා රවුම මැදට පැමිණි සිසුන්ට ද නැවත රවුමක් ආකාරයෙන් සෙමෙන් දිවීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට සිසුන්ට ලැබී ඇති සංඛ්‍යා මාරු කරමින් නැවත නැවත ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- බෑගයක් හෝ කුඩා පෙට්ටියක් හෝ සපයා ගන්න.
- ඊට බහාලිය හැකි ප්‍රමාණයෙන් රබර් බෝල / වෙනත් ද්‍රව්‍ය දහයක් ද සපයා ගන්න.
- ගුරුවරිය අහඹු ලෙස සිසුවකු ළඟට ගොස් එම බෑගයෙන් හෝ පෙට්ටියෙන් හෝ ලබා ගත යුතු ද්‍රව්‍ය සංඛ්‍යාව දෙමළ බසින් පවසන්න.

  *උදා :* **மூன்று தாருங்கள்** (මූන්රු තාරුංගළ්) තුනක් ගන්න
- එවිට අදාළ සිසුවා විසින් එම සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් ද්‍රව්‍ය ලබා ගත යුතු වේ.
- මේ ආකාරයට ගුරුතුමිය සිසුන් කිහිප දෙනෙකු ළඟට ගොස් ක්‍රියාකාරකම සිදු කරන්න.
- පසු ව ගුරුතුමිය වෙනුවට වෙනත් සිසුවකු අතට බෑගය හෝ පෙට්ටිය හෝ ලබා දී ක්‍රියාකාරකම දිගටම සිදු කරන්න.
- ගුරුතුමිය ලබා දුන් විධාන සිසුන් ලවා ම සිදු කරන්නේ නම් වඩාත් උචිත ය.
- මෙය සිසුන් කණ්ඩායම් වශයෙන් වෙන් කර වුව ද සිදු කළ හැකිය.

## නිපුණතාව : පාට නම් කරමින් සරළ වැකි කියයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- නිල්, කොළ , කහ, සුදු, කළු, රතු යන වර්ණ වෙන වෙන ම දැක්වෙන වර්ණ කාඩ්පත් 6 ලෙස සකසා ගන්න.
- වර්ණ කාඩ්පත් දෙමළ බසින් හැඳින්වීමට සිසුන් යොමු කරන්න.

  උදා - **நீல நிறம்** නිල නිරම්

  **பச்சை நிறம்** පච්චෛ නිරම්

  **வெள்ளை நிறம்** වෙල්ලෛ නිරම්................ ආදී වශයෙන්

- **வானம்** (වානම්)අහස, **இலை** (ඉලෛයි)කොළය. **வாழைப்பழம** (වාලෛප්පලම්) කෙසෙල්, **கொக்கு** ( කොක්කු)කොකා, **காகம** (කාහම්)කපුටා, **ஜம்பு** (ජම්බු) ජම්බු යන දේවල රූපය සපයා ගන්න.
- ඒවා පහත දැක්වෙන ආකාරයට වර්ණ කර ගන්න.

  අහස - නිල් පාට

  කොළය - කොළ පාට

  කෙසෙල් - කහ පාට

- රූප කාඩ්පත්වල දැක්වෙන රූප සිංහල බසින් හඳුන්වා දෙන්න.
- පසු ව අහස, කොළය, කෙසෙල් යන දේ දෙමළ බසින් හඳුන්වන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න.

  අහස -**வானம்** වානම්

  කොළය - **இலை** ඉලෛයි

  කෙසෙල් - **வாழைப்பழம்** වාලයිප්පලම්

- පසු ව එම රූපවල දැක්වෙන වර්ණ ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පසුව රූපයේ සහ වර්ණය යන දෙක ම එක් කර ඒවායේ වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරිමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* **வானம் நீல நிறம்** වානම් නීල නිරම් (අහස නිල් පාට යි)

  **இலை பச்சை நிறம்** ඉලෛයි පච්චෛ නිරම්(කොළය කොළ පාට යි)

- මේ ආකාරයට අනෙක් රූප ද හඳුන්වා දී එවායේ වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- අහස. කොළ, කෙසෙල්, කොකා, කපුටා වැනි දේ ඇතුළත් වන ආකාරයට වර්ණ නොගැන්වූ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- සෑම සිසුවකුට ම එකක් බැගින් වන සේ එම චිත්‍රවල පිටපත් ලබා දෙන්න.
- ගුරුවරයා පහත දැක්වෙන ආකාරයට සිසුන්ට උපදෙස් ලබා දෙන්න. ඒ අනුව චිත්‍රය වර්ණ ගැන්වීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* **வானம் நீல நிறம்** වානම් නීල නිරම්

  **இலை பச்சை நிறம** ඉලෛ පච්චෛ නිරම් . . . ආදී වශයෙන්

- සිසුන් විසින් චිත්‍ර වර්ණ ගන්වා අවසන් වූ පසු අහඹු ලෙස තෝරා ගන්නා සිසුන්ගෙන් එහි දැක්වෙන රූපවල ඇති වර්ණ පිළිබඳ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව : අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුවරයා විසින් තමන්ගේ දෙඅත්වලට පලඳවා ගත හැකි ආකාරයෙන් රූකඩ දෙකක් නිර්මාණය කරගන්න.

  *උදා :* කුරුල්ලෙක් සහ පූසෙක්

  හාවෙක් සහ බල්ලෙක්

- එක් අතක තිබෙන සත්ත්ව රූපය චලනය කරමින් ගුරුවරයා විසින් අනෙක් සත්ත්ව රූපයෙන් **எப்படி சுகம்?** (එප්පඩි සුහම් ?) සුවදුක් කොහොම ද යනුවෙන් විමසන්න.
- නැවත කටහඬ වෙනස් කර අනෙක් සත්ත්ව රූකඩය චලනය කරමින් **நல்ல சுகம்** (නල්ල සුහම්) හොඳින් ඉන්නවා ලෙස පිළිතුර ලබා දෙන්න.
- අප යම් අයකුගෙන් සුවදුක් කෙසේ ද යන්න විමසීමේ දී දෙමළ බසින් **'එප්පඩි සුහම්'** ලෙස විමසන බවත්, ඊට පිළිතුර වශයෙන් 'සුවෙන් සිටිනවා' යන්න **நல்ல சுகம்** 'නල්ල සුහම්' ලෙස පවසන බවත් පැහැදිලි කරන්න.
- නැවතත් රූකඩ යොදා ගනිමින් කිහිප වතාවක් දෙබස නැවත ඉදිරිපත් කරන්න.
- මේ ආකාරයට රූකඩවල සිටින සතුන් සිසුන්ගෙන් ද සිසුන් සතුන්ගෙන් ද වශයෙන් සුවදුක් විමසීම සිදු කරන්න.
- මේ ආකාරයට ගුරුවරයා විසින් සිසුන්ගෙන් ද **எப்படி சுகம்?** 'එප්පඩි සුහම්' ලෙස විමසා ඔවුන් වෙතින් පිළිතුර ලබා ගන්න.
- සිසුන්ට ද ගුරුවරයාගෙන් ඒ ආකාරයට විමසීමට අවස්ථාව ලබා දෙන්න. මෙම වැකි හොඳින් සිසුන් තුළ තහවුරු වන තෙක් සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ යුගල වශයෙන් හෝ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සමාන්තර පන්තියක ගුරුවරයකු/වෙනත් ගුරුවරයකු ගෙන්වා පන්තියේ සිසුන්ගෙන් මේ ආකාරයට සුවදුක් විමසීමට අවස්ථාව ලබා දී සිසුන් ඒ සඳහා පිළිතුරු ලබා දීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සුවදුක් විමසන ආකාරය හා ඊට පිළිතුරු ලබා දෙන ආකාරය ගීතයක් ආකාරයට සිසුන් සමඟ ගායනා කරන්න. මෙහිදී ගුරුවරයා විසින් ගීතය හොඳින් සිසුන්ට හුරුවන තෙක් ගායනා කර පසුව ප්‍රශ්නය එක් පාර්ශ්වයක් විසිනුත් පිළිතුර එක් පාර්ශ්වයක් විසිනුත් ලබා දෙන ආකාරයෙන් ද ගීතය ගායනා කරන්න.

| | | | |
|---|---|---|---|
| *උදා :* ගුරුවරයා | - | එප්පඩි සුහම් // | **எப்படி சுகம்?** // |
| සිසුන් | - | නල්ල සුහම් // | **நல்ல சுகம்** // |
| ගුරුවරයා | - | එප්පඩි සුහම් // | **எப்படி சுகம்?** // |
| සිසුන් | - | නල්ල සුහම් // | **நல்ல சுகம்** // |

**ක්‍රියාකාරකම 3:**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සෑම කණ්ඩායමක් ම පේළි ආකාරයෙන් සිටුවන්න.
- එම පේළි අතරින් පළමු පේළියේ සිසුන් පමණක් සිටගෙන සිටිමට සලස්වන්න.
- අනෙක් පේළිවල සිසුන් ඔවුන් සිටින ස්ථානයේ ම සිටගෙන සිටින සිසු පෙළ හොඳින් පෙනෙන ආකාරයෙන් වාඩි කරවන්න.
- සිටගෙන සිටින පේළියේ පළමු සිසුවා දෙවන සිසුවා වෙත හැරී දෙවන සිසුවාගෙන් .எப்படி சுகம்? (එප්පඩි සුහම්) සැප දුක් කොහොම ද යනුවෙන් විමසිය යුතු ය.
- එවිට දෙවන සිසුවා நல்ல சுகம் (නල්ල සුහම්) හොඳින් ඉන්නවා ලෙස පිළිතුර ලබා දිය යුතු ය.
- නැවත දෙවන සිසුවා තෙවන සිසුවා වෙත හැරී පෙර පරිදි ම විමසිම කළ යුතු අතර තෙවන සිසුවා ඊට පිළිතුරු ලබා දිය යුතු වේ.
- ප්‍රශ්නය ඉදිරිපත් කරන සිසුවා වෙත පිළිතුර ලැබුණු පසු ඔහු/ඇය පේළියේ තමා සිටි තැන ම වාඩි විය යුතු ය.
- මේ ආකාරයට පේළියේ අවසන් සිසුවා තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- පේළියේ අවසන් සිසුවා ගුරුතුමිය වෙත ගොස්, எப்படி சுகம்? (එප්පඩි සුහම් ?) ලෙස විමසිය යුතු අතර, ගුරුතුමිය ඊට ප්‍රතිචාර දැක්විය යුතු ය.
- මෙසේ අනෙක් පේළි සඳහා ද ක්‍රියාකාරකම සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව : එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ කිහිපයක් නම් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

* **பென்சில்** **(පෙන්සිල්)** - පැන්සල
* **மேசை** **(මේසෙ)** - මේසය
* **அடிமட்டம்** **(අඩිමට්ටම්)** - අඩිකෝදුව
* **கதிரை** (කදිරෙ) පුටුව
* **புத்தகம** (පුත්තහම්) පොත යන වචන පහ ඉගැන්වීම සඳහා පන්ති කාමරයෙන් ද්‍රව්‍ය සපයා ගන්න. නොඑසේ නම් කුඩා ආකෘති සකස් කර ගන්න.

- උපකරණ පහ වෙන වෙන ම පෙන්වමින් එම උපකරණ දෙමළ භාෂාවෙන් හඳුන්වන්න.
- නැවත නැවත එම ද්‍රව්‍ය සිසුන්ට ඉදිරිපත් කරමින් ඒවා දෙමළ බසින් හඳුන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- මෙතෙක් ඉගෙන ගත් උපකරණ (පොත, පැන්සල, මේසය, පුටුව, අඩිකෝදුව) සපයා ගන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- සිසුන් සිටින තැනට ආසන්න ව ද්‍රව්‍ය කිහිපයක් තබන්න.
- ඉතිරි උපකරණ තරමක් දුරින් තබන්න.
- ගුරුවරයා ළඟ ඇති උපකරණ පෙන්වමින්,
  *උදා :* * මේ පැන්සල
  * මේ අඩිකෝදුව
  * මේ පොත ලෙස හඳුන්වා දෙන්න.
- පෙන්වූ උපකරණවලට දෙමළෙන් කියන නම් සිසුන්ගෙන් විමසන්න.
- 'මේ පැන්සල' යනුවෙන් දෙමළෙන් කියන්නේ කෙසේ දැයි හඳුනා ගනිමු යැයි කියමින්,
  * **இது** (ඉදු) පෙන්සිල්'- මේ පැන්සල
  යන්න සිසුන්ට හඳුන්වා දෙන්න. සිසුන්ට වචන හුරු වන තෙක් උච්චාරණය කරන්න.
- මේ ආකාරයට **கதிரை** (කදිරෙ) පුටුව හා **மேசை** (මෙසෙ) මේසය වචන දෙකත් හඳුන්වා දෙන්න.
- අප ළඟ ඇති යම් දෙයක් පෙන්වීමට **இது** 'ඉදු' යන වචනය භාවිත කරන බව සිසුන්ට අවධාරණය කරන්න.
- ගුරුවරයා සිටි තැන ම සිට,
  * අර මේසය
  * අර පුටුව කියමින් දුරින් ඇති උපකරණ හඳුන්වා දෙන්න.
- මේසයට හා පුටුවට දෙමළෙන් කියන නම් සිසුන්ගෙන් විමසන්න.
- 'අර මේසය', 'අර පුටුව' යන්න දෙමළෙන් කියන ආකාරය හඳුනා ගනිමු යැයි පවසන්න.
- **அது மேசை** 'අදු මේසෙ' ලෙස හඳුන්වා දෙන්න.
- මෙය සිසුන්ට හුරු වන තෙක් උච්චාරණය කරන්න.
- **அது கதிரை**'අදු කදිරෙ' ද මෙලෙස ම හඳුන්වා දෙන්න.

- නැවත ගුරුවරයා සිසුන් සමග මේසය අසලට ගොස් එතැන ඇති උපකරණ **இது** 'ඉදු' යොදමින් ද, ඈතින් ඇති උපකරණ තුන **அது** 'අදු' යොදමින් ද හඳුන්වා දෙන්න.
- සිසුන්ට උච්චාරණය හුරු වන තෙක් මේ අයුරින් ක්‍රියාකාරකමේ නිරත වන්න.
- මෙම නිපුණතාව යටතේ සිසුන්ට හඳුන්වා දුන් වචන තව දුරටත් තහවුරු කිරීම සඳහා සිසුන් සමග මෙම ගීතය ගායනා කරන්න.
- ගීතයේ දැක්වෙන ආකාරයේ ද්‍රව්‍ය ද යොදා ගනිමින් ගීතය ගායනා කිරීම වඩාත් උචිත වේ.
- කණ්ඩායම් වශයෙන් හා තනි තනි ව ද ගීතය ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| 1. | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | එඩුංගළ් . . . | எடுங்கள் |
| 2. | අදු පේනෛ | அது பேனை |
| | අදු පේනෛ | அது பேனை |
| | අදු පේනෛ | அது பேனை |
| | තාරුංගළ් . . . | தாருங்கள் |
| 3. | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | එඩුංගළ් . . . | எடுங்கள் |
| 4. | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පේනෛ | இது பேனை |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | තාරුංගළ් | தாருங்கள் |


- අවට තිබෙන පෑන්, පැන්සල්, බෝතල් වැනි ද්‍රව්‍ය යොදා ගනිමින් ද මෙම ගීතය සිසුන් සමග ගායනා කරන්න.

## නිපුණතාව : ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.


### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1 :


- ඉදිආප්ප, පිට්ටු, ආප්ප, බත්, කිරිබත් යන කෑම වර්ග සහිත පින්තූර ළමයින්ට පෙන්වන්න.
- එම ආහාර වර්ග සිංහල බසින් හඳුන්වා දෙන්න.
- පසුව එම ආහාර වර්ගවල නම් එකිනෙක දෙමළ බසින් පවසන ආකාරය හඳුන්වා දෙන්න.%




இடியப்பம் (ඉඩියප්පම්) ඉඳිආප්ප




பிட்டு (පිට්ටු) පිට්ටු



சோறு (සෝරු) බත්



பாற்சோறு (පාට්සෝරු) කිරිබත්




அப்பம் (අප්පම්) ආප්ප

- මෙම ආහාර වර්ග තුනේ රූප එකින් එක පෙන්වමින් ගුරුවරයා විසින් නම් කරනු ලබන සිසුන්ගෙන් එම ආහාර වර්ගයට දෙමළ බසින් භාවිත කරන වචනය විමසන්න. සිසුන් සියලු දෙනාට ම ආහාර වර්ග පිළිබඳ ව හොඳින් අවබෝධ වන තෙක් මෙම ක්‍රියාකාරකමෙහි නියැළෙන්න.
- සිවු වනුව හා පස් වනුව හඳුන්වා දී ඇති ආහාර වර්ගවල නම් ද හොඳින් හුරු වන තෙක් සිසුන් ලවා එම වචන නැවත නැවත කියවන්න.

**ක්‍රියාකාරකම 2**

- ඉගෙන ගත් ආහාර වර්ගවල නම් භාවිත කරමින් මෙම ක්‍රීඩාව සිදු කරන්න.
- මේ සඳහා පහත දැක්වෙන ආකාරයට ආහාර වර්ගවල රූප යොදා ගනිමින් එක් සිසුවකුට එකක් බැගින් ලැබෙන සේ කාඩ්පත් සකස් කර ගන්න.
- විවිධ වර්ණවලින් කාඩ්පත් සකස් කර ගැනීම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී සිසුන් නිරීක්ෂණයට පහසු වනු ඇත.




- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- පින්තූර කාඩ්පත් එක බැගින් සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා විසින් එක් ආහාර වර්ගයක නමක් පවසන විට එම ආහාර වර්ගය සහිත රූප කාඩ්පත් හිමි සිසුන් රූපය ඔසවා තමාගේ අත ඇති රූපයේ දැක්වෙන දේ ශබ්ද නගා පැවසිය යුතු ය.

  *උදා* : ගුරුවරයා - **அப்பம்** අප්පම්

  ළමයි - ( රූපය පෙන්වමින්) අප්පම්
- මේ ආකාරයට ක්‍රියාකාරකම කිහිප වරක් සිදු කර රූප කාඩ්පත් සිසුන් අතර මාරු කරගන්න.
- පෙර පරිදි සෑම ආහාරයක් ම හොඳින් මතක සිටින තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 3:**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් කණ්ඩායම් පහකට බෙදන්න.
- සැම කණ්ඩායමක් ම පහත දැක්වෙන ආකාරයට ආහාර වර්ගය නමින් නම් කරන්න.




- ගුරුවරයා ආහාර වර්ගයක නම දෙවරක් පවසන විට එම ආහාර වර්ගයට අදාළ කණ්ඩායම දෙවරක් අත්පුඩි ගැසීම කළ යුතු බව පවසන්න.
- සැම කණ්ඩායමකට ම අත්පුඩි ගැසීමට හැකි වන සේ සියලු ම ආහාර වර්ගවල නම් දෙවරක් කියවන්න.
- සියලු ම කණ්ඩායම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථා කිහිපයක් ලබා දී නැවත එම කණ්ඩායම්වල ආහාර වර්ගවල නම් මාරු කරමින් ගුරුවරයා වෙනුවට සිසුවකු යොදා ගෙන මෙම ක්‍රියාකාරකම ආහාර වර්ගවල නම් පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම 4**

- සිසුන් එළිමහන් ස්ථානයකට කැටුව යන්න.
- සිසුන් ඉගෙන ගත් ආහාර වර්ගවල නම් සැම එකක් ම නියෝජනය වන පරිදි ඔවුන් නම් කරන්න.
- පන්තියේ සිටින සිසු සංඛ්‍යාවට එකක් අඩු වන සේ පුටු රවුමක් ආකාරයට තබා පුටුවල සිසුන් වාඩි කරවන්න.
- පුටුවක් අහිමි සිසුවා රවුම මැද සිටුවන්න.
- මැද සිටින සිසුවා ඉගෙන ගත් ආහාර වර්ග අතරින් එක් ආහාර වර්ගයක නම පැවසූ විට රවුමේ සිටින සිසුන් රවුම තුළ එහා මෙහා දුවමින් තමාට හිමි ආහාර වර්ගයේ නම ශබ්ද නගා උච්චාරණය කරන අතර පුටු මාරු කර ගත යුතු ය.
- ඒ අතර රවුම මැද සිටින සිසුවා හිස් පුටුවක වාඩිවීමට උත්සහ කළ යුතු වේ.
- නැවත පුටුවක් අහිමි වන සිසුවා රවුම මැදට පැමිණ පෙර පරිදි ක්‍රියාකාරකම සිදු කළ යුතු ය.

## නිපුණතාව : අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිප දෙනෙකු නම් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සිසුන් කණ්ඩායම් පහකට බෙදන්න.
- බල්ලා, පූසා, කපුටා, ගිරවා, ලේනා යන සතුන්ගේ විශාල ප්‍රමාණයේ රූප සපයා ගන්න.
- එම රූපවල සිටින්නෝ කවුරු දැයි සිසුන්ගෙන් විමසන්න. පසු ව එක් එක් සත්ව රූපයට අදාළ දෙමළ වචනය සිසුන්ට හඳුන්වා දෙන්න.

| | | |
|---|---|---|
| **நாய்** | නායි | (බල්ලා) |
| **பூனை** | පූනෙ | (පූසා) |
| **காகம்** | කාහම් | (කපුටා) |
| **கிளி** | කිළි | (ගිරවා) |
| **அணில்** | අණිල් | (ලේනා) |

- වචන හොඳින් තහවුරු කරගන්නා තෙක් එක් එක් සිසුවකුගෙන් එම සත්තු කවුරු ද යන්න විමසා පිළිතුර ලබා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- ක්‍රියාකාරකම 1 සඳහා නිර්මාණය කළ සත්ත්ව රූප දඬු රූකඩ ආකාරයෙන් සකස් කරගන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැටුව යන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවා ගුරුවරයා විසින් එක් අවස්ථාවක එක් දඬු රූකඩයක දැක්වෙන රූපය බැගින් සිසුන්ට පෙන්වන්න.
- එහි දැක්වෙන රූපයේ දෙමළ වචනය කිහිප වතාවක් කියවන්න.
- පසු ව එම සතාගේ චර්යාවන් (ගමන් කරන ආකාරය වැනි) නිරූපණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට අනෙක් සතුන්ගේ රූප ද ඉදිරිපත් කරමින් සිසුන් අදාළ වචනය උච්චාරණයටත් සත්ත්ව චර්යා අනුකරණයටත් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් කණ්ඩායම් 5කට බෙදන්න.
- සිසුන් එකිනෙකා පසුපස එකිනෙකා සිටින සේ පේළි ආකාරයට සිටගැනීමට සලස්වන්න.
- සෑම පේළියක ම පළමු සිසුවාට සකස් කරගත් එක් සතකුගේ (සකස් කරගත්) දඬු රූකඩය බැගින් ලබා දෙන්න.
- පේළි අතරින් එක් පේළියක සිටින සිසුන්ට රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වන්න.
- තම කණ්ඩායමට ලැබී ඇති සත්ව රූපය කණ්ඩායමේ අනෙක් සිසුන්ට ද පෙනෙන සේ ඔසවන ලෙස දඬු රූකඩය අතැති සිසුවාට පවසන්න.
- පසු ව ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව එම කණ්ඩායමේ සිසුන් විසින් අදාළ සත්ත්වයාගේ නම ප්‍රකාශ කර ඊට අනුරූප යම් හැසිරීමක් ඉදිරිපත් කළ යුතු වේ.
  *උදා :* සිසුන් - **காகம்** 'කපුටා'
  'කාක්' 'කාක්' යන හඬ නගමින් පියාඹන ස්වරූපයක් ඉදිරිපත් කළ යුතු වේ.
- එම කණ්ඩායමේ සිසුන් ඉදිරිපත් කිරීම් සිදු කරන අතර අනෙක් කණ්ඩායම්වල සිසුන්ට එම සතාගේ නම කියමින් ආමන්ත්‍රණය කළ හැකි වේ.

- නැවත ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව සිසුන් පේලියක් ආකාරයට සිටගත යුතු ය.
- කණ්ඩායම් 5 විසින් ම මේ ආකාරයට තමාගේ කණ්ඩායමට හිමි සත්ත්ව රූපයට අදාළ නම ප්‍රකාශ කර චර්යා ඉදිරිපත් කළ යුතු වේ.
- පසු ව කණ්ඩායම් සතු සත්ත්ව රූප මාරු කරමින් සතුන්ගේ නම් හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී රවුමට පැමිණෙන කණ්ඩායමේ සිසුන්ට අනෙක් සිසුන් ලවා විධාන ද ලබා දිය හැකි වේ.

*උදා :* **பூனை** පූනෙ ඕඩුංගල්

**நாய்** නායි තුල්ලුංගල්

**காகம்** කාහම් නිල්ලුංගල්

* දෙවන ජාතික භාෂාව ලෙස දෙමළ ඉගැන්වීමේ දි ගුරුවරයකු වශයෙන් ඔබට වැදගත් විය හැකි වචන කිහිපයක්

| | | |
|---|---|---|
| **வேண்டாம்** | වේණ්ඩාම් | එපා |
| **தெரியும்** | තෙරියුම් | දන්නවා |
| **தெரியாது** | තෙරියාදු | දන්නේ නෑ |
| **ஆம்** | ආම් | ඔව් |
| **இல்லை** | ඉල්ලෛ | නැහැ |